# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2145/52 – 2019 ඔක්තෝබර් 18 වැනි සිකුරාදා – 2018.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2018 නොවැම්බර් මස 14 වැනි දින අංක 2097/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2018 අංක 295 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන් ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩමේ කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2017/HA/574.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DS/GFG/L&L/4/81.
2019 ඔක්තෝබර් මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මලිගස්පේ (කසි 810019 කලාප 2) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක GA/GFG/2018/511 හා 2018.09.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් මායිම් තුළ වූ කොටස:

01. කැබලි අක්ෂර 'A' – පුංචිඅදාගොඩ වත්ත, වරි. අංක නොදනී – **ප්‍රමාණය: හෙක්. 0.1216**

උතුරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 2 කැබලි අංක 37, 33, 44 සහ 43; නැගෙනහිරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 2 කැබලි අංක 44, 43 සහ 48; දකුණට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 2 කැබලි අංක 49, 51 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B.

11 - 425